# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1988/6- 2016 ඔක්තෝබර් මස 10 වැනි සඳුදා - 2016.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BD/BD/LND/3/5/5.
*ඉඩම් සංවර්ධන අමා. යොමු අංකය* : 4/3/13/2013/ඊ/72.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ / පරවශතාවේ විස්තර*:

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්ලේන් ඇල්පීන් (80-H) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රිල්පොල කෝරලේ රඹුක්පොත ගමේ, හිගුරුගමුවවත්ත නැමැති ඉඩමට සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අ.ග.පි. 37 හි අතිරේකය 49 දරන හා 2016.08.23 දිනැති මූලික පිඹුරේ හෙක්ටයාර 6.2783ක් වූ ප්‍රමාණයට පහත විස්තර සඳහන් ඉඩම් කැබලි හා මායිම් ඇතුළත් උපලේඛනය - 01 හා

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්ලේන් ඇල්පීන් (80-H) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රිල්පොල කෝරලේ හංවැල්ල ගමේ, හිගුරුගමුවවත්ත නැමැති ඉඩමට සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අ.ග.පි. 80 හි අතිරේක අංක 56 දරණ හා 2016.08.23 දිනැති මූලික පිඹුරේ හෙක්ටයාර 3.8172ක් වූ ප්‍රමාණයට පහත මායිම් හා විස්තර සඳහන් ඉඩම් කැබැල්ල ඇතුළත් උපලේඛනය - 02

#### උපලේඛනය - 01

01. **කැබලි අංක 1065**
**ඉඩමේ නම: හිගුරුගමුව වත්ත; ඉඩම් පරිහරණය: වත්ත, අවු. 10 - 20 ක් පමණ වයසැති තේ වගාවක් සහ ලඳුකැලයක් ඇත; හිමිකම් කියන්නා: බලංගොඩ වැවිලි සමාගම; බිම් ප්‍රමාණය: හෙක්. 0.6745.**
*උතුරට*: කැබලි අංක 11; *නැගෙනහිරට*: කැබලි අංක 11 සහ 1066; *දකුණට*: කැබලි අංක 1066; *බටහිරට*: කැබලි අංක 1066 සහ 11.

02. **කැබලි අංක 1066**
**ඉඩමේ නම:—; ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන්නා: බලංගොඩ වැවිලි සමාගම; බිම් ප්‍රමාණය: හෙක්. 0.0735.**

*උතුරට*: කැබලි අංක 11 සහ 1065; *නැගෙනහිරට*: කැබලි අංක 1065, 11 සහ 1067; *දකුණට*: කැබලි අංක 11 සහ 1067; *බටහිරට*: කැබලි අංක 1067,11 සහ 1065.

03. **කැබලි අංක 1067**

**ඉඩමේ නම: හිගුරුගමුව වත්ත; ඉඩම් පරිහරණය: වත්ත, අවු. 10-20 ක් පමණ වයසැති තේ වගාවක් සහ ළදුකැලයක් ඇත; හිමිකම් කියන්නා: බලංගොඩ වැවිලි සමාගම; බිම් ප්‍රමාණය: හෙක්. 5.5303.**

*උතුරට*: අ.ග.පි.80 (හංවැල්ල) කැබලි අංක 11 සහ 1066; *නැගෙනහිරට*: කැබලි අංක 1066, 11 සහ 736; *දකුණට*: කැබලි අංක 11,736 සහ අ.ග.පි.80 (හංවැල්ල); *බටහිරට*: අ.ග.පි.80 (හංවැල්ල), කැබලි අංක 11 සහ 1066.

### උපලේඛනය - 02

01. **කැබලි අංක 919**

**ඉඩමේ නම: හිගුරුගමුව වත්ත; ඉඩම් පරිහරණය: වත්ත, අවු.10 - 20 ක් පමණ වයසැති තේ වගාවක් සහ ළදුකැලයක් ඇත; හිමිකම් කියන්නා: බලංගොඩ වැවිලි සමාගම; බිම් ප්‍රමාණය: හෙක්. 3.8176.**

*උතුරට*: කැබලි අංක 33 සහ අ.ග.පි.37 (රඹුක්පොත ගම); *නැගෙනහිරට*: කැබලි අංක 33 සහ අ.ග.පි.37 (රඹුක්පොත ගම) සහ කැබලි අංක 686; *දකුණට*: කැබලි අංක 686 සහ 33; *බටහිරට*: කැබලි අංක 33.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2016 නොවැම්බර් මස 09 වැනි දින ප. ව. 2.30ට බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ඔක්තෝබර් මස 26 වැනි දිනට මත්තෙන් මෙම ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන ,
ප්‍රාදේශීය ලේකම් ,
බදුල්ල.

2016 ඔක්තෝබර් මස 14 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10—1274

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.